4 වන පිටෙන්

අගාධයෙන් ගොඩඑන්නට නොහැකි බව මෛත්‍රී රනිල් ආණ්ඩුව තේරුම් ගෙන ඇත. එවැනි ආධාර ලබා ගන්නට නම් අප සමාජය ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී රටවල් පිලිගන්නා මානව හිමිකම් ආරක්ෂා කරන සමාජයක් බව ලෝකය හමුවේ ප්‍රදර්ශනය කළ යුතුව තිබේ. ආණ්ඩුව දැන් උත්සාහ කරන්නේ තමා ඉදිරියේ ඇති එම අභියෝගය ජයගන්නටය. එහිදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා හැටියට මෛත්‍රී අනුගමනය කළ උපාය මගින් පාර්ලිමේන්තුවේ බහුතර කැමැත්තක් ලැබීම රට පැත්තෙන් සිතන විට යහපත්ය. එහෙත් ඒ සමගම දේශපාලන වශයෙන් ප්‍රතිපත්තිමය ස්ථාවරයන් ගත යුතු කරුණු සම්බන්ධයෙන් ඇමති, රාජ්‍ය ඇමති, නියෝජ්‍ය ඇමති තනතුරුවලින් අල්ලස් දීම වැනි උපක්‍රම යොදන්නට සිදුවීමෙන් පක්ෂයක පරිහානිය කොතෙක්දැයි ප්‍රදර්ශනය වන බව ද අමතක කළ යුතු නොවේ.

මහින්ද අනුගමන කළ ක්‍රියාකලාපය නිසා ජාත්‍යන්තරය ඉදිරියේ අප අමාරුවට පත් වූ බව ඔහුගේ කැබිනට් මණ්ඩලයේ දශකයකට කිට්ටු කාලයක් සිටි අය දැන් දැන් කියනු ඇසෙයි. මේ අය එදා ඇමතිවරුන් ලෙස සිටියදී මානව හිමිකම් සම්බන්ධයෙන් සේ ම අනෙක් සෑම දෙයක් සම්බන්ධයෙන් දැරුවේ රටට යහපත් ස්ථාවරයන් නොවේ. ඔවුහු කිසිවෙක් මහින්දට හෝ ගෝඨාභයට ඉඟියකින් හෝ විරුද්ධත්වයක් නොපෑ අතර සියල්ලෝම මහින්ද කළ කී දෑ සියල්ල අනුමත කළහ. ඔවුන් එදා එසේ කළේ මහින්දට බියෙන්ද? ඒ බිය ඇමතිකම් නැතිවේය යන බියද නැත්නම් මරණ බයද? ඇමතිකම් නැතිවේය යන බයෙන් සියල්ල අනුමත කළේ නම් ඔවුන් හැඳින්වීමට සුදුසු වචනය වන්නේ ගෝස්තරවාදීන් යන්නය. මරණ බයට එසේ කළේ නම් ඔවුහු නිවට බියසුල්ලෝය. ඒ දෙකෙන් කොයික වුවත් ඔවුන් තවදුරටත් මේ රටේ ඇමතිකම් දැරීමට සුදුසුකම් ඇත්තන් වන්නේද? අපගේ අදහස වන්නේ මෙවැන්නන්ට ඇමතිකම් කිරීමට නොව දේශපාලනයේ නිරතවන්නට පවා සුදුසුකම් නැත. මෛත්‍රී රටට පොරොන්දු වී ඇති යහපත් දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමේ කටයුත්ත මෙවැනි ගෝස්තරවාදීන් නැතහොත් බියසුල්ලන් සමග කළ නොහැකි බව සක්සුදක් සේ පැහැදිලිය. එහෙත් මෛත්‍රී මහමැතිවරණයෙන් පරාජය වූ කිහිප දෙනෙකු ද ඇතුළුව එවැනි නුසුදුස්සන් ගණනාවකට ඇමතිකම් පිරිනමා ඇත. ඔහු මෙසේ නුසුදුස්සන්ට ඇමතිකම් දුන්නේද එසේ දීම සඳහා ඇමතිවරු ගණන අනූවකට වඩා වැඩි කළේද තමා බලයට පත් කරන්නට උරදුන් සිවිල් සංවිධානවල අදහස් තුට්ටුවකට නොසලකමිනි. දින සියයේ කාලයේදී මසකට තුන් හතර වතාවක් සිවිල් සංවිධාන නියෝජිතයන් මුණගැසුණු ජනාධිපතිවරයා මහමැතිවරණයෙන් පසු ඒ හමුවීම් අත්හැර දමා ඇත්තේ 'දේශපාලනය කියන්නේ මේකයි, ඒක තේරුම් ගනිල්ලා' යයි කියන්නාක් මෙනි.

අද ඇති ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මීට වැඩි දෙයක් බලාපොරොත්තු විය නොහැකි බව යථාර්ථයක් බව අපි දනිමු. අපගේ ප්‍රශ්නය වන්නේ ජනාධිපතිතුමා රටට දුන් පොරොන්දු මේ අයත් සමග ඉටුකළ හැකි වේද යන්නයි. ඒ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 64වැනි සංවත්සරය අවස්ථාවේදී ජනාධිපතිවරයා අවධාරණයෙන් කී 'පක්ෂයේ පූර්ණ ප්‍රතිසංවිධානය' කෙසේ කවදා සිදුවන්නක්ද යන්න ද තවත් ප්‍රශ්නයකි.

මැති ඇමති වරදුන මගින් දිනාගත් පිරිස මානව හිමිකම් ප්‍රශ්නයේදී ජනාධිපතිවරයා සමග හිඳිමින් යෝජිත පරීක්ෂණය වෙනුවෙන් පෙනීසිටින අතර මහින්ද රාජපක්ෂ කල්ලිය ඊට විරුද්ධව රට අවුස-සන සැලසුම් සකස් කරමින් සිටිනු පෙනේ. ඔවුන් ද තවමත් සිටින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ම ය. ලිබරල් පක්ෂයක් තුළ විවිධ මත දරන්නන් සිටිය හැකි නමුත් රටට අතිශයින් ම වැදගත් රටට තීරණාත්මක ලෙස බලපාන කරුණු සම්බන්ධයෙන් නායකත්වයේ ස්ථාවරයට සම්පූර්ණයෙන් ප්‍රති පක්ෂ ස්ථාවරයක් දරමින් ඒ මතවාදය වෙනුවෙන් ජනයා අවුස්සන්නට ඉඩ දී සිටීම කුමන ප්‍රජාතන්ත්‍රවාදයක් දැයි අපට නම් නොවැටහේ. ජනාධිපතිතුමා කියන්නේ මෙයද 'යථාර්ථය' හැටියට බාර ගතයුතු බවද?

යම් යම් කරුණු සම්බන්ධයෙන් සිවිල් සමාජයෙන් විවේචන එල්ල වන විට ජනාධිපතිවරයා 'ඇනෙන' කතාවක් කීවා අපට මතකය. ''මම වේගයෙන් යන කෙනෙක් නොවෙයි. මගේ ගමන හෙමින්.'' යයි එතුමා කීවේය. ඊට කලින් අවස්ථාවක එතුමා කී දෙයක්ද මීට අදාලව අපට මතක් වෙයි. ''මම අවුරුදු හතලිස් හතක දේශපාලන අත්දැකීම් තියෙන කෙනෙක්''

එතුමා මේ අවස්ථා දෙකේදීම කීවේ 'මම මොනවද කරන්නේ කියල ටිකක් ඉවසල බලාගෙන ඉන්නවලා' යන්න හැර වෙන කිසිවක් නොවේ. ඉතින් අපි ඉවසිල්ලේ බලා සිටිමු. එසේ බලා සිටින අතර එතුමා ජනාධිපති බවට පත්වූ අලුත රටට දුන් පොරොන්දු ද නිතර නිතර මතක් කරමු.

- **දූෂණ වංචාවලට සම්බන්ධ වූවන්ට පක්ෂය තරාතිරම නොබලා දඩුවම් දෙනවා.**
- **රට දූෂණයෙන් වංචාවෙන් හා අපරාධවලින් තොර රටක් බවට පත්කරනවා.**
- **ජාතීන් අතර සංහිඳියාව ගොඩනගනවා.**
- **විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා.**
- **මනාප ක්‍රමය නැති කර රටට ගැලපෙන අලුත් ඡන්ද ක්‍රමයක් ඇති කරනවා.**
- **යහපත් දේශපාලන සංස්කෘතියක් ඇතිකරනවා.**
- **දේශපාලනයේ පවුල්වාදය නැති කරනවා.**

## සිනුවර නිපදවෙන ස්වතන්ත්‍ර වේදිකා නාට්‍යය

# දෙලොවක් අතර හතක්

**රසික සූරියආරච්චි**

ශ්‍රී ලංකාවේ සිට ස්වකැමැත්තෙන් අභිනිෂ්ක්‍රමණය කර අද ඕස්ට්‍රේලියාව වාසභූමිය කොටගෙන ඩයස්පෝරික ජීවිත ගෙවමින් සිටින අපේ විඩාබර සිත් සනසන ආකාරයේ මිහිරි තොරතුරක් මෙලෙස ඔබ හා බෙදා ගන්නට සිතුවෙමි.

කවි බසෙන් සිනුවර ලෙසින් විරුදවලි ලබා ඇති සිඩ්නි පුරවරයේ වෙසෙන කලාකාමී පිරිසක් එකතු වී මේ දිනවල වේදිකා නාට්‍යයක් නිපදවමින් සිටිති. සිනුවර කලාකරුවෙකු වන සිසිල් ෆොන්සේකා රචනා කර නිෂ්පාදනය කරන මේ




ප්‍රහසනය "දෙලොවක් අතර හතක්" යනුවෙන් නම් කර ඇත.
කලකට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රේක්ෂක ප්‍රසාදය ලබමින් තිරගත වූ "එතෙර බැඳි සෙනෙහස" සහ "පරම්පරා" නම් ජනප්‍රිය ටෙලි නාට්‍ය ද්වය රචනා කොට අධ්‍යක්ෂණය කළ පලපුරුදු නාට්‍යකරුවෙකු වන සිසිල් ෆොන්සේකා මින් පෙර සිනුවර පැවැත්වුණු සංස්කෘතික කලා ප්‍රසංග සඳහා කෙටි නාට්‍ය විශාල සංඛ්‍යාවක් ද ලියා අධ්‍යක්ෂණය කර තිබේ. මේ ඔහු ගේ ප්‍රථම සම්මත ප්‍රමාණයේ වේදිකා නාට්‍යයයි.

"දෙලොවක් අතර හතක්" නාට්‍යයේ අනෙක් විශේෂත්වය වන්නේ මෙය මුළුමනින් ම සිනුවර කලාකරුවන් ගේ නිර්මාණයක් වීමයි. පිටපත් රචනය, අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, රංගපෑම, වේෂ නිරූපනය, වේදිකා පරිපාලනය සහ සංගීතය යනාදී සියළුම අංශවලින් "දෙලොවක් අතර හතක්" නාට්‍යයට සම්මාදම් වන්නෝ කාලයක් තිස්සේ තම හැකියාවන් සිනුවර සිංහල වැසියන්ට පෙන්වා ඇති අපේම සහෘදයෝ ය.

"දෙලොවක් අතර හතක්" චරිත නිරූපනය ප්‍රසන්න සම්පත් ජයවීර, ශ්‍රියාකාන්ති රණසිංහ, ප්‍රේමතිලක රණසිංහ, සුනිල් ද සිල්වා, මිහිරි ප්‍රනාන්දු, සිසිල් ෆොන්සේකා සහ රවි බෝවතුර ගෙනි. සිසිල් ෆොන්සේකා සංගීතයෙන් ද, අයෝමි බස්නායක බොස්කෝ වේෂ නිරූපනයෙන් ද, කිංස්ලි ගුණවර්ධන පසුතල නිර්මානයෙන් ද දායකත්වය සපයන අතර වේදිකා පරිපාලනය අනිල් ප්‍රනාන්දු ගෙනි.

සිසිල් ෆොන්සේකා ලියා අධ්‍යක්ෂණය කළ " දෙලොවක් අතර හතක්" වේදිකා නාට්‍යය නො-වැම්බර් මස 13 දින සිඩ්නි නුවර තදසන්නයේ පිහිටි ඩොන් මෝ රඟහලේ දී වේදිකා ගත වීමට නියමිතයි.

සිනුවර ස්වතන්ත්‍ර සිංහල නාට්‍ය කලාව දිනේවා...!




Cartoon by PK




**To let**

Mount Waverley , Granny Flat, one bedroom, living area and kitchen, Gas heating/ cooking and AC, Separate unit with all amenities. Close to secondary collage public transports.
Suits to a couple.$225 pw.

**Text: 0423304673**